**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**

**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ----------------------------------------
   (මුල්'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ----------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ------------------------
4. කලාපය : ------------------------
5. පළාත : ------------------------

| **7 ශ්‍රේණිය** | **භාෂා භාවිතය හා අවබෝධය** | **කාලය පැය 02** |
|---|---|---|

## <u>I කොටස</u>

I, II යන කොටස්වල **ප්‍රශ්න සියල්ලට ම** පිළිතුරු සපයන්න.

(01) නිවැරදි අකුර හිස්තැනට යොදා වචන සම්පූර්ණ කරන්න.

(i) අව..................නම (ධා / දා)

(ii) තෘෂ්..................ව (ණා / නා)

(iii) අධිෂ්..................නය (ටා / ඨා)

(iv) ප්‍රාන්..................ය (ත / ථ)

(v) උච්..................රණය (ඡා / චා)

(vi) නිශ්..................බ්දතාව (ශ / ෂ)

(vii) සම්මිශ්‍ර..................ය (න / ණ)

(viii) වර්ග..................ලය (ප / ඵ)

(ix) ගිරිශි..................ර (ඛ / ක)

(x) මර්..................නය (ද / ධ)

(ලකුණු 1 x 10 = 10)

(02) පහත පදවල අර්ථය ලියන්න.

(i) ප්‍රාගුණ්‍යය - ----------------------------------------

(ii) අවශේෂ - ----------------------------------------

(iii) පාටව කිරීම - ----------------------------------------

(iv) උරණ - ----------------------------------------

(v) හසළ - ---------------------------------------- (ලකුණු 1 x 5 = 5)

(03) (අ) පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

(i) අල්ලපු අත්තත් නෑ ..............................................................

(ii) .............................................................. ගෙදර ගියොත් අඹු නසී.

(iii) ..............................................................හකුරු හැංගුවා වගේ

(iv) ඇටි කෙහෙල් කාපු ..............................................................

(v) .............................................................. කබල්ලෑවා රිංගුවා වගේ

(ලකුණු 1 x 5 = 5)

(ආ) පහත දැක්වෙන ඉඟි වැකිවල අර්ථ ලියන්න.

(i) දවල් හීන බලනවා ........................................

(ii) ඉල්ලගෙන කනවා ........................................

(iii) කිඹුල් කඳුළු හෙළනවා ........................................

(iv) මයිල් කෙළින් වුණා ........................................

(v) ලෑල්ලට පාගලා ගියා ........................................

(ලකුණු 1 x 5 = 5)

(04) මෙහි දැක්වෙන ඉරි ඇඳි පදය සඳහා **විරුද්ධ පදය** යොදා වාක්‍යය නැවත ලියන්න.

(i) අද දින මුහුද ඉතා <u>චංචල</u> ය.

........................................

(ii) දියණිය පවුලට <u>නම්බුවක්</u> බව පියා කීවේ ය.

........................................

(iii) සමන් වූ කලී <u>නිහතමානී</u> ගුණ ඇත්තෙකි.

........................................

(iv) කස්තුරි <u>දුලභ</u> ඖෂධයකි.

........................................

(v) <u>පටු</u> අදහස් සමාජයෙන් තුරන් කළ යුතු ය.

(ලකුණු 1 x 5 = 5)

........................................

(05) පහත සඳහන් යෙදුම්වලට සුදුසු තනි පද ලියන්න.

(i) නොනවත්වා ධාවනය වන ........................................

(ii) වෙනත් ජාතියකට අයත් ........................................

(iii) මඩෙහි උපන් ........................................

(iv) විස්තර කැටි කර දැක්වීම ........................................

(v) තාපසයන් ජීවත් වන ස්ථානය ........................................

(ලකුණු 1 x 5 = 5)

(06) කමත් භාෂාවට අයත් පහත සඳහන් පදවල අදහස ලියන්න.

(i) මහප්පිඩ - ........................................

(ii) ඉපනැල්ල - ........................................

(iii) අත්තම - ........................................

(iv) රසබෝ්ය - ........................................

(v) මුත්තා - ........................................

(vi) පැගිරිබෝ්ය පුරනවා - ........................................

(vii) මල් පාවර කරනවා - ........................................

(viii) මෝල්කඩ - ........................................

(ix) මුත්තෙට්ටුව - ........................................

(x) කොළමුත්තා - ........................................

(ලකුණු 1 x 10 = 10)

(07) පහත පද සඳහා අනුක්ත පද ලියන්න.

(i) බල්ලෙක් ..........................  (ii) කාන්තාවක් ..........................

(iii) තොපි ..........................  (iv) අපි ..........................

(v) මගීහු .......................... (ලකුණු 1 x 5 = 5)

(08) උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි වන සේ හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) තරු පෙළ අහසේ ..........................(දිලෙයි / දිලෙති)

(ii) වඩු කුරුල්ලෝ අලංකාර කූඩු .......................... (තනයි / තනති)

(iii) නුඹලා හෙට වෙසක් බලන්නට.......................... (යන්නෙහු / යති)

(iv) ඔබ වෙළෙඳසලින් බඩු මිල දී.......................... (ගත්තෙහි / ගත්තේ ය.)

(v) ගුරුවරු අපට ප්‍රශංසා .......................... (කළෙමු / කළහ.)

(vi) ගස සුළඟට .......................... (වැනෙයි / වැනෙති)

(vii) නංගී ද මම ද පාසල් .......................... (ගියෙමි / ගියෙමු)

(viii) කිසිවෙක් ගීත ගායනා .......................... (කරයි / කරති)

(ix) ගංගාවෝ ගලා..........................(බසියි / බසිති)

(x) ඕ තොමෝ අභරණින් .......................... (සැරසුණා ය./ සැරසුණහ.)

(ලකුණු 1 x 10 = 10)

## II කොටස

(09) පහත සඳහන් පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගොම්මන් කරුවලේ අන්දර වැටිය ළඟින්
අන්තිම කුරුලු ගී හඬ මිය ඇදෙන පැයින්
නිම්හිම් නැතිව සෙනෙහස හද තුරුළු කරන්
අම්මා වඩිනවා සව් සැප අපට අරන්

පනහේ රුපියලේ රටකජු අලෙවි කොට
හුණු දුම්කොළ බුලත් පුවකුත් සල්ලි කොට
අව් පූටකේ සිට දහවල් නොකා සිට
අම්මා වඩියි අප කුසගිනි නිවන්නට

අව්වට රත් ව බැබළෙන රුපියල් වලට
සිදු වන දෙය එක ය හැම දා සැඳෑවට
බස් නැවතුමට යාබද ලොකු කඩයකට
ඒවා දිය යුතු ය වේලක් ගෙවන්නට

කළුවන් කළු මුහුණ අව්වට කළු ගැහුණු
රළුවන් රළු දෑත දෙපය ද කළු ගැසුණු
රතුවන් රතු දෙතොල මුව දත් විට සැපුණු
හිතුවත් ඇති ය අම්මා ගැන මට ලැබුණු

(i) අම්මා පැමිණෙන්නේ දවසේ කුමන වේලාවක ද?

..........................................................

(ii) ඇය විසින් අලෙවි කෙරෙනා ද්‍රව්‍ය 4 ක් ලියන්න.

(iii) සැම දිනක ම මුදල් කඩයට දෙන්නේ ඇයි?

(iv) අවසන් කවියේ ඇතුළත් කාව්‍යාලංකාර දෙකක් ලියන්න.

(v) පහත පදවල අර්ථ පහදන්න.

1. නිම්හිම් නැතිව

2. අවි පූටකේ

(ලකුණු 4 x 5 = 20)

(10) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මහනුවර හෙවත් සෙංකඩගල නගරය ලංකාවේ දෙවන විශාලතම නගරය යි. වර්තමානයේ ශ්‍රී දළදා මාලිගාව පිහිටා ඇත්තේ ද මෙහි ය. මහනුවර නගරය කඳුවලින් වට වී මහනුවර සානුවෙහි පිහිටා තිබේ. මහනුවර නගරය ශ්‍රී ලංකාවේ නගර අතරින් ඉතා විචිත්‍ර වූ නගරයකි. මෙය මහනුවර, මාතලේ, නුවරඑළිය යන දිස්ත්‍රික්කවලින් සැදුම්ලත් මධ්‍යම පළාතේ අගනගරය යි. මෙය යුනෙස්කෝව විසින් ලෝක උරුමයක් වශයෙන් ද නම් කර ඇත.

පුරාණයේ දී මහනුවර රාජධානිය කන්ද උඩරට, සෙංකණ්ඩ ශෛලපුරය, ශ්‍රී වර්ධනපුර යනාදී නම්වලින් හඳුන්වා තිබේ. මහනුවර නගරයෙහි ඉතා සෞම්‍ය කාලගුණයක් පවතින හෙයින් බොහෝ සංචාරකයින් මෙහි පැමිණීමට කැමති ය. ආර්ථික වශයෙන් මහනුවර දෙවෙනි වන්නේ කොළඹ නගරයට පමණි. ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රමුඛ පෙළේ ආයතනවල ශාඛා මහනුවර නගරයෙහි පිහිටා ඇත.

(i) මහනුවර නගරයෙහි භූගෝලීය පිහිටීම දක්වන්න.

(ii) මධ්‍යම පළාතට අයත් දිස්ත්‍රික්ක නම් කරන්න.

(iii) මහනුවර හඳුන්වන වෙනත් නම් සතරක් ලියන්න.

(iv) සංචාරකයින් මෙම නගරයට ආශා කරන්නේ ඇයි?

(v) පහත සඳහන් පදවලට සමාන පද ඡේදයෙන් සොයා ලියන්න.

1. විසිතුරු - 2. දායාදයක් -

3. සුමුදු - 4. ප්‍රධාන -

(ලකුණු 4 x 5 = 20)

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ------------------------------------------------
   (මුල’කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : --------------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ---------------------
4. කලාපය : ----------------------------------------
5. පළාත : ----------------------------------------

| **8 ශ්‍රේණිය** | **භාෂා භාවිතය හා අවබෝධය** | **කාලය පැය 02** |
|---|---|---|

I, II කොටස්වල **ප්‍රශ්න සියල්ලට ම** පිළිතුරු සපයන්න.

## I කොටස

(01) පහත එක් එක් පේළියේ ඇති නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

i. කොට්ඨාශය / කොට්ඨාසය
ii. ප්‍රස්ථාව පිරුළු / ප්‍රස්තාව පිරුළු
iii. ප්‍රදර්ශනය / ප්‍රදර්ශණය
iv. මර්ධනය / මර්දනය
v. ශිෂ්ටාචාරය / ශිෂ්ඨාචාරය
vi. පරිගණකය / පරිඝණකය
vii. ප්‍රතිපල / ප්‍රතිඵල
viii. වීරෝධාර / වීරෝදාර
ix. කණිෂ්ඨ / කනිෂ්ඨ
x. කළමනාකරණය / කලමනාකරණය

(ලකුණු 1 X 10 = 10)

(02) වරහන් තුළින් සුදුසු පද තෝරා හිස්තැන් හි යොදන්න.

i. විශාල පෙට්ටියේ තිබෙන භාණ්ඩ බිඳෙන ................ (සුලු ය. / සුළු ය.)
ii. ඇගේ ...................... ගායනය මිහිරි ය (කන්කළු / කන්කලු)
iii. මෙවර ලේකම් ධුරය .................... නිමල් දක්ෂයෙකි. (දරණ / දරන)
iv. ශ්‍රී දළදා ..................... පිහිටියේ මහනුවර ය. (මාලිගාව / මාළිගාව)
v. ............................. සුළඟ ගතට සුවදායක ය. (අළුයම / අලුයම) (ලකුණු 1 X 5 = 5)

(03) (අ) පහත පදවල අර්ථය ලියන්න.

i. ආචිර්ණ කල්පිත ............................................
ii. අටසාලිස් ............................................
iii. මහණ ගොයුම්හු ............................................
iv. ස්ථානෝචිත ප්‍රඥාව ............................................
v. පුරාණෝක්ති ............................................ (ලකුණු 1 X 5 = 5)

(ආ) පහත ඉඟි වැකිවල අර්ථය ලියන්න.

i. අමු කැවිලා ..........................................................

ii. බක තපස් රැකීම ..........................................................

iii. පොරකටු ගෙවිලා ..........................................................

iv. දෙහි කපනවා ..........................................................

v. අත දෙනවා .......................................................... (ලකුණු 1 X 5 = 5)

(04) පහත පදවලට විරුද්ධාර්ථවත් පද ලියන්න.

i. තිමිර ..........................................................

ii. මෘදු ..........................................................

iii. අනුලෝම ..........................................................

iv. උත්තම ..........................................................

v. ප්‍රවීණ .......................................................... (ලකුණු 1 X 5 = 5)

(05) පහත පදවලට සමානාර්ථ පද ලියන්න.

i. අරවින්ද ..........................................................

ii. දිවයුරු ..........................................................

iii. වසුන්දරා ..........................................................

iv. සුරමග ..........................................................

v. පිළිමල් .......................................................... (ලකුණු 1 X 5 = 5)

(06) නිවැරදි අතීත කාල ආඛ්‍යාත පද ලියන්න.

i. ඕ තොමෝ ගමට ..........................................................

ii. ගංගාවෝ ගලා ..........................................................

iii. මම පාඩම් ..........................................................

iv. මවක් දරුවෙකු ..........................................................

v. තොපි පාසල් ..........................................................

vi. වෛද්‍යවරු රෝගීන් සුවපත් ..........................................................

vii. ගොවියා කුඹුරට ..........................................................

viii. තරු රැන ..........................................................

ix. පියුම්හු විකසිත ..........................................................

x. පියාණෝ අවවාද .......................................................... (ලකුණු 1 X 10 = 10)

(07) (අ) පහත දැක්වෙන නාම පදවල අනුක්ත රූප ලියන්න

i. තොපි ..........................................................

ii. ඔවුහු ..........................................................

iii. කාන්තාව ..........................................................

(ආ) පහත පද සඳහා තනිපද ලියන්න.

iv. අහස පොළව එකට ගැවෙන්නා සේ පෙනෙන ස්ථානය ..........................................................

v. ලීයෙන් තැනූ .......................................................... (ලකුණු 1 X 5 = 5)

(08) (අ) පහත පිරුළු සම්පූර්ණ කරන්න.

i. ආචාරියා .......................................... හැදුවා වගෙයි.

ii. ....................................... කැබැල්ලෑවා රිංගුවා වගෙයි.

iii. ...................................... පක්ෂියා වගෙයි.

iv. කටුස්සාගේ කරේ .................................

v. .......................................... පේන ඇහුවා වගෙයි. (ලකුණු 1 X 5 = 5)

(ආ) පහත දැක්වෙන යුගල පදවලට සුදුසු පද යොදා යුගල පද සම්පූර්ණ කරන්න.

i. ....................................... මාන්න

ii. ...................................... දොඩා

iii. සුද්ද .......................................

iv. රොඩු .................................

v. ................................ පොවා (ලකුණු 1 X 5 = 5)

## II කොටස

(09) පහත පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දහඩිය පෙරාගෙන මහ දහවල ගින්නේ
වැලි බත් උයන අවදියෙ ගෙයි පිළිකන්නේ
මා ඇය දුටුව බව ඇය කොහොමද දන්නේ
හඳ වාගෙයි එදා ඈ බැබලුණ පින්නේ

ඇගෙ නෙත අහිංසක රසයට උල්පතය
ඇගෙ මොළකැටි ගතිය රැඳුණේ මල්වෙතය
සඳ හිරු පළමු බැලුවේ ඇගෙ පැල්පතය
එහි හැමතැනම මිහිරි ගෙ සුරතල් වතය

i. මෙහි සඳහන් දැරියගේ නම කුමක් ද?

.......................................................................................................... (ලකුණු 4)

ii. කවියා ඇය හඳුනන්නේ කොපමණ කලක සිට ද?

.......................................................................................................... (ලකුණු 4)

iii. පළමු කවියේ ඇති උපමාවක් හා උපමේයක් වෙන් කර ලියන්න.

උපමාව ..........................................................................................

උපමේය .......................................................................................... (ලකුණු 4)

iv. ස්වභාව ධර්මයේ වස්තූන් පවා ඈ කෙරෙහි සැලකිලිමත් වූ බව කවියා දක්වන්නේ කෙසේද?

.......................................................................................................... (ලකුණු 4)

v. අර්ථය ලියන්න. සුරතල් වත ..................................................

මොළකැටි ගතිය ................................................ (ලකුණු 4)

(ලකුණු 4 X 5 = 20)

(10) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දියුණු වන ලෝකයේ ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජ රටාවට අනුව ජීවත් වීමේදී අවශ්‍ය දැනුම, අත්දැකීම්, යහපත් ආකල්ප, නිපුණතා වර්ධනය අපට අත්‍යවශ්‍ය වේ. ජනගහන වර්ධනය හා නාගරික බලපෑම නිසා පවුල හා ජන සමූහයා අතර සම්බන්ධතා ඉතාම අඩු වී තිබේ. මෙබඳු පරිසරයක් යටතේ හැදෙන වැඩෙන දරුවාට ජීවත් වීමේදී ගැටලු හා ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවේ. එහෙයින් කාංසාව, බිය, ලැජ්ජාව වැනි අයහපත් චිත්තවේගවලට ගොදුරු වී සිතින් පීඩා විඳින පුද්ගලයන් බිහිවීමට ඉඩ ඇත. මේ නිසා කුඩා දරුවන් තුළ යහපත් චිත්තවේග වර්ධනය කිරීමට වැඩිහිටියන් වඩාත් උනන්දු විය යුතුය. ඒ අනුව එම වගකීම් ඉටුකිරීම සඳහා පුද්ගලයාගේ පෞරුෂය කෙරෙහි බලපාන සාධක පිළිබඳ දැනුවත්වීම අවශ්‍ය වේ.

i. ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජ රටාව අනුව ජීවත් වීමේදී අපට අත්‍යවශ්‍ය සාධක 4ක් ලියන්න.

.............................................................................................................

............................................................................................................. (ලකුණු 4)

.............................................................................................................

ii. පවුල හා ජන සමූහය අතර සම්බන්ධතාව අඩුවීමට බලපෑ කරුණු 2ක් ලියන්න.

.............................................................................................................

............................................................................................................. (ලකුණු 4)

.............................................................................................................

iii. මෙහි සඳහන් අයහපත් චිත්තවේග 2ක් ලියන්න.

.............................................................................................................

............................................................................................................. (ලකුණු 4)

.............................................................................................................

iv. මෙම ගැටලු සහගත තත්ත්වය යටතේ වැඩිහිටියන් වඩාත් උනන්දු විය යුත්තේ කුමකට ද?

.............................................................................................................

............................................................................................................. (ලකුණු 4)

.............................................................................................................

v. වැඩිහිටියන් තම වගකීම ඉටු කිරීමට නම් දැනුවත් විය යුත්තේ කුමන කරුණක් සම්බන්ධව ද?

.............................................................................................................

............................................................................................................. (ලකුණු 4)

.............................................................................................................

(ලකුණු 4 X 5 = 20)

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ................................................................................
   (මුල'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ................................................................................
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ........................................
4. කලාපය : ........................................
5. පළාත : ........................................

| 9 ශ්‍රේණිය | භාෂා භාවිතය හා අවබෝධය | කාලය පැය 02 |
|---|---|---|

## I කොටස

I, II යන කොටස්වල **ප්‍රශ්න සියල්ලට ම** පිළිතුරු සපයන්න.

(01) අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) රූඩි / රූධි / රූඪි
(ii) දෘෂ්ඨිය / දෘශ්ටිය / දෘෂ්ටිය
(iii) ශිඛරය / ෂිඛරය / ශිකරය
(iv) නිර්මානය / නිර්මාණය / නිමාණිය
(v) සන්තුෂ්ඨිය / සන්තුශ්ටිය / සන්තුෂ්ටිය
(vi) ශ්‍රේශ්ඨ / ශ්‍රේෂ්ඨ / ශ්‍රේෂ්ට
(vii) ප්‍රතිපෝශනය / ප්‍රතිපෝෂනය / ප්‍රතිපෝෂණය
(viii) ජ්‍යෝෂ්ඨ / ජේෂ්ඨ / ජ්‍යෝෂ්ට
(ix) සෞන්දර්‍ය / සෞන්දර්ය / සෞන්ධර්ය
(x) පරිගණකය / පරිඝණකය / පරිගනකය (ලකුණු 1 x 10 = 10)

(02) පහත පදවල අර්ථය ලියන්න.

(i) එකුරුත්තේ - ........................................
(ii) අසනිපාතය - ........................................
(iii) කලත්‍රයා - ........................................
(iv) ගවේෂණය - ........................................
(v) කණ්ඨ - ........................................ (ලකුණු 1 x 5 = 5)

(03) හිස්තැනට යෝග්‍ය පද යොදා පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

(i) අබුද්දස්ස කාලේ ........................................
(ii) ........................................ කොට්ටේ මාරු කළා වගේ
(iii) කොහොඹ ගහට ........................................
(iv) ........................................ ඇතාගේ හැටි කීවා වගේ
(v) කතාව දෝලාවෙන් ........................................ (ලකුණු 1 x 5 = 5)

(04) පහත සඳහන් පදවල ප්‍රකෘතිය සහ ප්‍රත්‍යය වෙන් කර ලියා දක්වන්න.

(i) ඇතැමෙක් - ------------------------------------ ------------------------------------

(ii) කුරුල්ලෝ - ------------------------------------ ------------------------------------

(iii) ගස - ------------------------------------ ------------------------------------

(iv) බලන - ------------------------------------ ------------------------------------

(v) ලියති - ------------------------------------ ------------------------------------

(ලකුණු 1 x 5 = 5)

(05) පහත සඳහන් පද අයත් වන ක්‍රියා පද වර්ගය ලියන්න.

(i) කියතොත් - ------------------------------------

(ii) නැගෙද්දී - ------------------------------------

(iii) බලනු - ------------------------------------

(iv) කරවයි - ------------------------------------

(v) යමින් - ------------------------------------

(ලකුණු 1 x 5 = 5)

(06) පහත සඳහන් පද සඳහා සමානාර්ථවත් පදයක් හා විරුද්ධාර්ථවත් පදයක් ලියන්න.

| | | සමාන පදය | විරුද්ධ පදය |
|---|---|---|---|
| (i) | වස්ත්‍ර | - ------------------------------------ | ------------------------------------ |
| (ii) | චල | - ------------------------------------ | ------------------------------------ |
| (iii) | දිටු | - ------------------------------------ | ------------------------------------ |
| (iv) | පුරිස් | - ------------------------------------ | ------------------------------------ |
| (v) | උදක | - ------------------------------------ | ------------------------------------ |

(ලකුණු 1 x 10 = 10)

(07) (අ) පහත දක්වෙන කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

(i) යහළුවෝ මිදුලෙහි සතුටින් සෙල්ලම් කළහ.

--------------------------------------------------------------------------------

(ii) නුඹලා වැල්ලේ අකුරු ලියන්නෙහු?

--------------------------------------------------------------------------------

(iii) මම සිංහල හා හින්දු අලුත් අවුරුදු දිනයේ දී පැළයක් සිටවූයෙමි.

--------------------------------------------------------------------------------

(iv) ගොවියෝ ගවයන් පාලනය කරති.

--------------------------------------------------------------------------------

(v) අපි සියලු අනතුරුවලින් දරුවන් ආරක්ෂා කරමු.

------------------------------------------------------------------ (ලකුණු 1 x 5 = 5)

(ආ) පහත දැක්වෙන කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයට හරවන්න.

(i) ලේකම්වරයා විසින් වාර්තාව ඉදිරිපත් කෙරිණි.

--------------------------------------------------------------------------------

(ii) කොටින් විසින් මුවෝ අල්ලනු ලැබෙති.

--------------------------------------------------------------------------------

(iii) ඔවුන් විසින් ආහාර පිළියෙළ කෙරිණි.

--------------------------------------------------------------------------------

(iv) පාරිභෝගිකයන් විසින් වෙළෙන්දා පසසනු ලැබේ.

--------------------------------------------------------------------------------

(v) නිලධාරියා විසින් පරීක්ෂණයක් කරනු ලැබිණි.

--------------------------------------------------------------------------------

(ලකුණු 1 x 5 = 5)

(08) පහත සඳහන් වාක්‍ය ව්‍යාකරණානුකූලව නිවැරදි කර ලියන්න.

(i) විදුහල්පතිවරයා ද ගුරුවරුන් ද උත්සවයට සහභාගී වූහ.

--------------------------------------------------------------------------------

(ii) සියලු සත්ත්වයෝ සුවපත් වේවා!

--------------------------------------------------------------------------------

(iii) අම්මාත්, තාත්තාත්, මමත් චාරිකාවක් ගියෙමි.

--------------------------------------------------------------------------------

(iv) දියණියෝ උපාසිකාවට උපකාර කළා ය.

--------------------------------------------------------------------------------

(v) අයෙක් කම්කරුවන්ට බැණ වදියි.

--------------------------------------------------------------------------------

(ලකුණු 2 x 5 = 10)

## II කොටස

(09) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මනෝ විද්‍යාවේ මතකය යනු ජීවියෙකු තුළ තොරතුරු ගබඩා කිරීමට, රඳවා ගැනීමට හා ඒවා නැවත එළි දැක්වීමට ඇති හැකියාවයි. පාරම්පරික අධ්‍යයන අනුව දර්ශන විද්‍යාවේ මුල් කාලයේ සිට කෘත්‍රිම ක්‍රම හරහා බුද්ධිය දියුණු කිරීම මගින් මතකය පිළිබඳ අධ්‍යයනය කිරීම ඇරඹී ඇත.

19 වන සියවසේ අග භාගයේ දී සහ 20 වන සියවසේ මුල් භාගයේ දී ගුණාත්මක මනෝ විද්‍යාව තුළට 'මතකය' ද ඇතුළත් කෙරිණි. නූතන දශකයේ දී ගුණාත්මක මනෝ විද්‍යාව, විද්‍යාවේ ප්‍රධාන අංගයක් බවට පත් ව ඇත.

මතක කාලය, ස්වභාවය හා තොරතුරු ගබඩා කර ගන්නා ආකාරය මත පදනම් ව මතකය වර්ගීකරණය කළ හැකි ය. මතකය ඇති විට රඳවා ගැනීමේ අවස්ථා තුනකි. එනම්, තොරතුරු ලැයිස්තුගත කිරීම, ගබඩා කිරීම හා නැවත සිහි ගැන්වීම යි.

(i) මනෝ විද්‍යාවට අනුව මතකය යනු කුමක් ද?

--------------------------------------------------------------------------------

(ii) දර්ශන විද්‍යාවේ මුල් කාලයේ සිට මතකය පිළිබඳ අධ්‍යයනය කළේ කෙසේ ද?

---------------------------------------------------------------------------------

(iii) ගුණාත්මක මනෝ විද්‍යාව තුළට මතකය ඇතුළත් කෙරුණේ කුමන කාලවල ද?

---------------------------------------------------------------------------------

(iv) මතකය වර්ගීකරණය කළ හැක්කේ කුමන කාරණා මත පදනම්ව ද?

---------------------------------------------------------------------------------

(v) මතකය රඳවා ගැනීමේ අවස්ථා 03 ක් නම් කරන්න.

---------------------------------------- ----------------------------------------

----------------------------------------

(ලකුණු 4 x 5 = 20)

(10) පහත පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කුසට අහරක් නොලැබ රිසි සේ
අපේ බඩගිනි නිවන් නේ
අනෝරා දුක් දරයි රහ සේ
නෙතින් නැත බිම හෙළන් නේ

වැදූ දරු හිස කිරුළු පලඳින
සුහ සිහින නිති දකින්නේ
දරුට මව් මෙන් සෙනෙහෙ පානා
ළඳක් කෝ කොයි සිටින්නේ

කුසට ආ කල එ දරු නසනා
කලියුගේ මව්වරුන් සේ
රුදුරු පව්කම් කළේ නැත ඔබ
දෑ දෙපා මගෙ සරි කළේ

යහ ගුණෙන් නැණ වඩවමින්
ලෝ දිනන මඟ හෙළි කළේ
පාරමී දම් පුරමී මතු මතු
මගේ මව් ඔබ වන ලෙසේ

(i) මෙහි කියවෙන මව නෙතින් නොහෙළන්නේ මොනවා ද?

---------------------------------------------------------------------------------

(ii) "වැදූ දරු හිස කිරුළු පලඳින සුහ සිහින නිති දකින්නේ" යන්නෙහි අදහස විස්තර කරන්න.

---------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------

(iii) කලියුගයේ මව්වරුන්ගේ ස්වභාවය විස්තර කරන්න.

---------------------------------------------------------------------------------

(iv) මෙහි දක්වෙන කාව්‍යාලංකාරයක් හා ඒ සඳහා නිදසුනක් ලියන්න.

---------------------------------------------------------------------------------

(v) පහත පදවල අර්ථය ලියන්න.

1. අනෝරා වැසි - ---------------------- 3. ලෝ දිනන - ----------------------
2. සරි කළේ - ---------------------- 4. රුදුරු පව්කම් -----------------------

(ලකුණු 4 x 5 = 20)

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ----------------------------------------------------------------
   (මුල'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ------------------------------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ---------------------------
4. කලාපය : ------------------------------------
5. පළාත : ------------------------------------

| **10 ශ්‍රේණිය** | **භාෂා භාවිතය හා අවබෝධය** | **කාලය පැය 03** |
|---|---|---|

## I කොටස

I, II, III යන කොටස්වල **ප්‍රශ්න සියල්ලට ම** පිළිතුරු සපයන්න.

(01) අක්ෂර වින්‍යාසය සදොස් ලෙස යෙදී ඇති වචනය තෝරා එය පමණක් නිදොස් කොට තිත් ඉර මත ලියන්න.

(i) අභයගිරිය හා ජේතවනය අනුරාධපුරයෙහි පිහිටි තවත් ප්‍රදාන ආරාම දෙකකි.

---------------------------------------------------------------------------

(ii) භාෂාවක සජීවි බව පළ කිරීමට සාම්ප්‍රධායික යෙදුම් භාවිත වේ.

---------------------------------------------------------------------------

(iii) එතුමා කළ කතාව එතුමාගේ සමාජ ජීවිතය තුල කරන ලද ශ්‍රේෂ්ඨතම කතාව ලෙස පිළිගැනේ.

---------------------------------------------------------------------------

(iv) එය විශේෂාංග ලිපියක් නිර්මාණය කිරීමේ කුසලතාව වර්දනය කිරීමේ අරමුණින් සම්පාදනය වූවකි.

---------------------------------------------------------------------------

(v) ගොවිතැන සමඟ අත්‍යන්තයෙන් ම බැඳුණු අනෙක් මහාර්ග නිර්මාණය නම් වැවයි.

---------------------------------------------------------------------------

(vi) භාෂාවක ලේඛණ ව්‍යවහාරයේ දී නිවැරදි අක්ෂර භාවිතය අක්ෂර වින්‍යාසය යි.

---------------------------------------------------------------------------

(vii) ලංකාවෙහි ම ඖෂධ නිපදවීම ඔහුගේ ඊළඟ අරමුණ විය.

---------------------------------------------------------------------------

(viii) නිවාස ඉදි කිරීම සහ ඒවායේ ජීවත් වීම ශිෂ්ඨාචාරික ලක්ෂණයකි.

---------------------------------------------------------------------------

(ix) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ පරෙවි හා සැළලිහිණි සංදේශ කෝට්ටේ යුගයට අයත් ය.

---------------------------------------------------------------------------

(x) වෙළෙඳ දැන්වීමක දී භාෂාව නිවැරදි ව භාවිත කිරීම අත්‍යාවශ්‍ය ය.

---------------------------------------------------------------------------

(ලකුණු $\frac{1}{2} \times 10 = 5$)

(02) පහත සඳහන් අක්ෂර වර්ග නම් කරන්න.

(i) ඞ, ඤ, ණ, න, ම ------------------------------------------------

(ii) ඟ, ඦ, ඬ, ඳ, ඹ ------------------------------------------------

(iii) ශ, ෂ, ස, හ, ෆ ------------------------------------------------

(iv) ය, ර, ල, ව ------------------------------------------------

(v) ඛ, ඡ, ඨ, ථ, ඵ ------------------------------------------------

(ලකුණු 1 x 5 = 5)

(03) (අ) පහත දක්වෙන එක් එක් පදයට විරුද්ධාර්ථ දෙන පදය බැගින් ලියන්න.

(i) ජංගම ------------------------------

(ii) ස්වාධීන ------------------------------

(iii) විකසිත ------------------------------

(iv) ලෞකික ------------------------------

(v) ස්වාභාවික ------------------------------

(ලකුණු $1/2$ x 5 = 2 $1/2$)

(ආ) පහත දක්වෙන එක් එක් පදයට සමාන අර්ථය දෙන පදය බැගින් ලියන්න.

(i) සියපත ------------------------------

(ii) පාෂාණ ------------------------------

(iii) සහසැස් ------------------------------

(iv) අග්නි ------------------------------

(v) අනංගයා ------------------------------ (ලකුණු $1/2$ x 5 = 2 $1/2$)

(04) (අ) පහත දක්වෙන ක්‍රියා පද අයත් වන්නේ කිනම් ක්‍රියා පද වර්ගයට දැයි ඉදිරියෙන් ලියන්න.

(i) ලැබේවා ------------------------------------------------

(ii) බල බලා ------------------------------------------------

(iii) නටවයි ------------------------------------------------

(iv) බැලුවොත් ------------------------------------------------

(v) යද්දී ------------------------------------------------ (ලකුණු $1/2$ x 5 = 2 $1/2$)

(ආ) පහත දක්වෙන යුගල පද සම්පූර්ණ කරන්න.

(i) කන ------------------------------------------------

(ii) ගරු ------------------------------------------------

(iii) නින්දා ------------------------------------------------

(iv) වත් ------------------------------------------------

(v) මඟුල් ------------------------------------------------

(ලකුණු $1/2$ x 5 = 2 $1/2$)

(05) පහත දැක්වෙන එක් එක් යෙදුම්වලින් කියැවෙන අදහස්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළු වරහන් තුළින් තෝරා ලියන්න.

(i) ඇතිවත් නොහැකි නැතිවත් නොහැකි බව

---

(ii) ජන්ම ගති වෙනස් කළ නොහැකි බව.

---

(iii) උදව් ලබන්නට ගිය අයගෙන් ම විපත් පැමිණීම.

---

(iv) වැඩක් ගත නොහැකි දෙයක් දීම.

---

(v) විශාල බලාපොරොත්තුවක් ඇතිව සිටිය ද ප්‍රතිඵලය අල්ප වීම.

---

(පුංචි අම්මා ඇවිත් කැවුම් පුංචි කළා වගේ / උණු හින්දා බොන්නත් බෑ කිරි හින්දා අහක දාන්නත් බෑ / වඳින්න ගිය දේවාලේ හිස මත කඩා වැටුණා වාගේ / බල්ලන්ට ලෙලි පොල් දුන්නා වගේ / වඳුරා හැට පිරුණත් බිම ගමන් නැතිලු)

(ලකුණු 1 x 5 = 5)

(06) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කොට ලියන්න.

(i) කේ.ජයතිලක විශිෂ්ට ලේඛකයෙකු වෙයි. ---

(ii) මිනිස්සු අවංක නොවන්නේ ඇයි? ---

(iii) පයින් යන්නෝ පාරේ දකුණු පසින් යා යුතුය. ---

(iv) සොරු දෙදෙනෙක් අත්අඩංගුවට පත් විය. ---

(v) අපි නීතිගරුක පුරවැසියන් වෙමු. ---

(ලකුණු 1 x 5 = 5)

(07) පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

(i) ගායක ගායිකාවෝ රසිකයන් පිනවති. ---

(ii) පක්ෂ නායකයෙක් සාමාජිකයන් කැඳවයි. ---

(iii) ඉංජිනේරුවෝ පරිගණක ක්‍රියා කරවති. ---

(iv) තත්කාලීන සාහිත්‍යධරයෝ සාහිත්‍ය කෘති රචනා කළහ.

---

(v) අනාථ දැරිය ඇගේ සහෝදරියන් හඳුනා ගත්තා ය.

--- (ලකුණු 1 x 5 = 5)

(08) පහත සඳහන් සන්ධි පද විසන්ධි කර ලියන්න.

(i) උපනූපන් - ---

(ii) දිනිසුරු - ---

(iii) ගිනියම් - ---

(iv) ළිංපඩිය - ---

(v) වක්කඩ - ---

(ලකුණු 1 x 5 = 5)

(මුළු ලකුණු 40)

## II කොටස

(09) පහත සඳහන් පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කුළුණු ගුණෙන් යුතු උතුමන් සිත මහ     රූ
දුදන බසින් නො යෙදෙයි කරනට නපු     රූ
නව රුවනින් පිරි මහ සමුදුර ගැඹු     රූ
තණ සුලකින් උණු කළ හැකි වෙති කවු     රූ

තුල සිය දිවි පුරුදුව විසුව ද     නොමඳ
දුල ගුණ සුදනන්ගේ නො දකිති දනෝ     දද
විල වැඩි මැඩිහු නො දනිති පියුමෙහි     සුවඳ
වල බිඟු එ මුවරද ගෙන මත් ව දෙති     නද

සත් ගුණ යුත් සතන් හට වැඩ කළොත්     සරු
අත් පිට දියුණුව ම පල දේය නිර     තුරු
වත් කළ දිය නෙරළු තුරු මුලට පිය     කරු
දෙත් මුදුනෙන් පල රස ඊගෙන අම     යුරු

අමිත ගුණ නුවණ යුතු උතුමෝ     පබඳ
අනත වෙහෙස ලදුවත් නොම වෙති     දුගද
දිගත පතළ සුවඳැති සොඳ සඳුන්     කඳ
සිඳිත මඩිත එක ලෙස පැතිරෙයි     සුවඳ

(i) මෙහි සඳහන් මහ සමුදුරෙහි ගුණාංග දෙකක් සඳහන් කරන්න.

-----------------------------------------------------------------------

----------------------------------------------------------------------- (ලකුණු 4)

(ii) මෝඩයන් තමා ළඟින් ඇසුරු කරන සුදනන්ගේ ගුණ දැන ගැනීමට අපොහොසත් වීම සමාන කර ඇත්තේ කෙසේ ද?

(ලකුණු 4)

-----------------------------------------------------------------------

(iii) පද්‍ය පන්තියේ සඳහන් කර ඇති ආකාරයට ගස මුලට වත් කළ ජලය අපට ආපසු ලැබෙන්නේ කෙසේ ද?

(ලකුණු 4)

-----------------------------------------------------------------------

(iv) "මිනිසෙකුගේ උසස් ගති ගුණ හෙළි වන්නේ ඔහු දුෂ්කර අවස්ථාවන්ට මුහුණ දෙන විට ය." එම අදහස ඉදිරිපත් කරන පද්‍ය කොටස තෝරා ලියන්න.

-----------------------------------------------------------------------

(ලකුණු 4)

(v) පහත පදවල අර්ථ දක්වන්න.

1. මුවරද -----------------------------------------------------------
2. අමයුරු -----------------------------------------------------------
3. දුල -----------------------------------------------------------
4. අමිත ----------------------------------------------------------- (ලකුණු 4)

(ලකුණු 20)

(10) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිසාගේ සාමූහික ජීවිතය ඇරැඹුණු දා පටන් තමන් අත්දුටු දෑ සෙස්සන්ට පැවසීමට යෑමෙන් කතා කලාව බිහිවිණැයි කියනු ලැබේ. ඊජිප්තුවේ හා අරාබියේ මෙන් ම ඉන්දියාවේත් මෙම කතා කලාව ප්‍රචලිත ව පැවති බවට බොහෝ සාධක ඇත. එම රටවල පැන නැගී කතා කලාව ක්‍රි.පූ. යුගයට අයත් ලෙස පිළිගැනෙයි. එකල ම ග්‍රීසියේත් රෝමයේත් මෙබඳු ම කතා කලාවක් පැවති බවට සාධක ලැබේ. ක්‍රිස්තු වර්ෂයෙන් පසු පර්සියාව, බ්‍රිතාන්‍යය, ජර්මනිය, ප්‍රංශය ආදී බොහෝ රටවල කියැවුණු සහ ලියැවුණු මෙබඳු කතා රාශියක් අදත් ශේෂව පවතී. එහෙත් එසේ ඇරැඹුණු කතා කලාවේ මුල් අවදියේ කතාන්දර ක්‍රමයෙන් ඔබ්බට නොගියේ ය. ආරම්භයකුත් ශරීරයකුත් අවසානයකුත් එක් ව ගෙන ඇමිණුනු සිද්ධි නිරූපණයකට ඒවා සීමා වූ අතර විනෝදාස්වාදය ලබා දීම, ආදර්ශයක් ලබා දීම, කිසිවෙකුගේ යහගුණ වැනීම, මවිතයක් ජනිත කිරීම ආදිය ඒවායේ පරමාර්ථ වූයේ ය.

(i) මෙම ඡේදය සඳහා සුදුසු මාතෘකාවක් යොදන්න.

---

(ii) කතා කලාව බිහිවීම පිළිබඳව කතුරවයා දක්වන අදහස කුමක් ද?

---

(iii) ක්‍රි.පූ. යුගයට අයත් ලෙස පිළිගැනෙන කතා කලාව බිහි වූ රටවල් 04ක් නම් කරන්න.

1. ---------------- 2. ----------------

3. ---------------- 4. ----------------

(iv) මුල් අවදියේ කතා කලාවේ සිද්ධි නිරූපණය පිළිබඳව කතුවරයා දක්වන අදහස කුමක් ද?

---

(v) පහත සඳහන් පදවලට සමාන පද ඡේදයෙන් උපුටා ලියන්න.

1. අන්‍යයන්ට - ---------------- 2. පැතිරුණ - ----------------

3. ඉතිරිව - ---------------- 4. පුදුමයක් - ----------------

(ලකුණු 4 x 5 = 20)

## III කොටස

(11) පහත දක්වෙන ඡේදය එහි ප්‍රමාණයෙන් **තුනෙන් එකක් වන සේ** සාරාංශ කර ලියන්න.

මාර්ටින් වික්‍රමසිංහයන් විසින් පාදා දෙන ලද කෙටි කතා මාවත ඔස්සේ යමින් සිංහල කෙටි කතාව උත්තම තලයකට ගෙන ආ කෙටි කතා කරුවන් තිදෙනා වශයෙන් ජී.බී. සේනානායක, කේ. ජයතිලක, ගුණදාස අමරසේකර යන අය හඳුන්වා දිය හැකි ය. ඔවුහු සිංහල කෙටි කතාවේ නිම් වළලු පුළුල් කළහ. ජී.බී. සේනානායකගේ කතාවලට වස්තු වූයේ නාගරික හා අර්ධ නාගරික මධ්‍යම පන්තියයි. ඔහුගේ කතා රුසියන් හා ප්‍රංශ කෙටි කතා අනුකරණයෙන් සකස් විණැ යි විචාරකයෝ දකිති. කේ. ජයතිලකයන් පුළුල් පරාසයක අත්දැකීම් මගින් කෙටි කතාව පෝෂණය කළ කතාකරුවා ය. සෞන්දර්යාත්මක බව හා කලාත්මක ගුණය අතින් ඔහුගේ කෙටි කතා විශේෂත්වයක් දරනේනේ ය. ගුණදාස අමරසේකරයන්ගේ කෙටි කතා ප්‍රේමය, ආදරය වැනි මනෝභාවයක් උද්දීපනය කළ වඩාත් තාත්විකත්වයට බර වූ ඒවා ලෙස හැඳින්විය හැකි ය. ඔහුගේ කෙටිකතා ගැමි මෙන් ම නාගරික අත්දැකීමෙන් ද බර විය. ජී.බී. සේනානායකයන්ගේ දුප්පතුන් නැති ලෝකය, පලිගැනීම හා මිතුරිය, කේ. ජයතිලකයන්ගේ පුනරුප්පත්තිය, කටු සහ මල්, වජිර පබ්බත හා අතීරණය, ගුණදාස අමරසේකරයන්ගේ රතු රෝස මල, ජීවන සුවඳ, එකම කතාව, කතා පහක්, ගල් පිළිමය හා බොල් පිළිමය කෙටි කතා කෘතීන් එම ක්ෂේත්‍රයට සිංහල පාඨක බඹරුන් කැඳවූ සුවඳැති රෝස කුසුම් වී යයි කිවහොත් ඒ නිවැරදි ය.

(ලකුණු 20)

(මුළු ලකුණු 100 යි)

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරඟාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරඟ)**

1. අපේක්ෂකයාගේ නම : ------------------------------------------------
(මුල්'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ------------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ----------------
4. කලාපය : ----------------------------------------------------------
5. පළාත : -----------------------------------------------------------

| 11 ශ්‍රේණිය | භාෂා භාවිතය හා අවබෝධය | කාලය පැය 03 |
| --- | --- | --- |

I, II, III යන කොටස්වල **ප්‍රශ්න සියල්ලට ම** පිළිතුරු සපයන්න.

## I කොටස

(01) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) උත්පත්ති ස්ථානය අනුව ඔ, ඕ, ඖ අක්ෂර අයත් අක්ෂර කාණ්ඩය නම් කරන්න.

------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

(ii) 'ඥ' අක්ෂරය සෑදී ඇති අක්ෂර දෙක ලියන්න.

------------------------------ ------------------------------

(iii) අක්ෂර මාලාවේ සංයුක්ත ස්වර දෙක ලියන්න.

------------------------------ ------------------------------

(iv) අඝෝෂ ඌෂ්මාක්ෂර දෙකක් ලියන්න.

------------------------------ ------------------------------

(v) 'කර' යන වචනයේ ඇති අක්ෂර වර්ග දෙක ලියන්න.

------------------------------ ------------------------------

(ලකුණු 1 x 5 = 5)

(02) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා ලියන්න.

(i) ප්‍රස්තුථය, නිෂ්ප්‍රභ, දෘෂ්‍යමාන- ------------------------------
(ii) නීත්‍යානුකුල, දෘෂ්ටිය, සාමාර්ථය ------------------------------
(iii) ප්‍රාශ්වාස, සම්භාශණය, කාර්යක්ෂම ------------------------------
(iv) කොට්ඨාශය, ප්‍රත්‍යාර්ථ, කණගාටුව ------------------------------

(ලකුණු $\frac{1}{2}$ x 4 = 2)

(03) පහත සඳහන් පදවලට විරුද්ධ පද ලියන්න.

(I) අතිශයෝක්තිය - -------------------- (iv) අධම - --------------------
(ii) ආධුනික - -------------------- (v) උත්කෘෂ්ට - --------------------
(iii) අද්‍යතන - --------------------

(ලකුණු 1 x 5 = 5)

(04) පහත සඳහන් නම් අකාරාදී පිළිවෙළට සකස් කරන්න.

(i) පොළොන්නරුව, මහනුවර, දඹදෙණිය, කෑගල්ල, කුරුණෑගල

---------------------------------------------------------------------------

(ii) මුදු පුත්තු, මහාසාර, මකරාක්ෂයා, වරෙන්තු, ජනේලය

---------------------------------------------------------------------------

(iii) බුවනෙකබාහු, වීරබාහු, පරාක්‍රමබාහු, විමලධර්ම, රාජසිංහ

---------------------------------------------------------------------------

(ලකුණු 1 x 3 = 3)

(05) (අ) පහත දක්වෙන පද යුගලයේ පළමු පදයට හෝ දෙවන පදයට ගැළපෙන පරිදි අනෙක් පදය වෙනස් කර ගළපා ලියන්න.

(i) දුර්ලභ ඔසු ------------------------------------

(ii) රුස් ධාරාව ------------------------------------

(iii) අර්ථ විමසුම ------------------------------------

(ලකුණු 1 x 3 = 3)

(ආ) පහත සඳහන් පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර ලියන්න.

(i) මළුවෙහි ------------------------------ ------------------------------

(ii) කොක්කු ------------------------------ ------------------------------

(iii) මියැසිය ------------------------------ ------------------------------

(iv) මිතුරා ------------------------------ ------------------------------

(ලකුණු $\frac{1}{2}$ x 8 = 4)

(06) පහත සඳහන් කොටස්වල ඉරි ඇඳි පද අයත් ව්‍යාකරණ වර්ගය නම් කරන්න.

(i) **සිහිල්'ඕන්** පිරි නිල් ජලාගේ ------------------------------------

(ii) ගනේ මිණි පැමිණි කිරණෙ'ව් **සතපාය** ------------------------------------

(iii) **පරක් තෙරක්** නැති සමුදුර සොබනා ------------------------------------

(iv) අරුණලු කැන් **විහිදෙත** දස අත ------------------------------------

(v) නුඹවත් මගෙ බස් **අසනුය** නිතිනි ------------------------------------

(vi) ගිරි මුදුන **පවා** කුසුමන් පිබිදී ------------------------------------

(vii) **සිඟිති** පයින් මට සටහන් පාලා ------------------------------------

(viii) කතා **කරන** බෝනික්කෝ පියා සලන සූටික්කෝ ------------------------------------

(ලකුණු $\frac{1}{2}$ x 8 = 4)

(07) (අ) පහත සඳහන් වාක්‍ය නිදොස් කොට ලියන්න.

(i) ප්‍රවීණ ගායකයෝ සංගීත ප්‍රසංගයට පැමිණෙති'යි රසිකයෝ සිතූහ.

---------------------------------------------------------------------------

(ii) ඔවුන් සියල්ලන් ම සොහොයුරන් මෙන් වැඩ කළෝ ය.

---------------------------------------------------------------------------

(ලකුණු 1 x 2 = 2)

(ආ) පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

(i) පරිත්‍යාගශීලීහු පාසල් දරුවන්ට පාසල් උපකරණ බෙදා දුන්හ.

-----------------------------------------------------------------------------------------

(ii) ක්‍රීඩා පුහුණුකරුවෝ ජයග්‍රහකයන් පැසසූහ.

-----------------------------------------------------------------------------------------

(iii) ගුරුවරු සිසුන්ට උපදෙස් දෙති.

-----------------------------------------------------------------------------------------

(iv) අපි නගරයේ දී නුඹලා දක්කෙමු.

-----------------------------------------------------------------------------------------

(ලකුණු 1 x 4 = 4)

(08) (අ) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි වර්ගය නම් කරන්න.

| | විසන්ධිය | සන්ධි වර්ගය |
|---|---|---|
| (i) පරමාදර්ශය | ----------------------------- | ----------------------------- |
| (ii) නියංසාය | ----------------------------- | ----------------------------- |
| (iii) නරෝත්තම | ----------------------------- | ----------------------------- |

(ලකුණු $^1/_2$ x 6 = 3)

(ආ) පහත සඳහන් කොටස්වලට තනිපද ලියන්න.

(i) හැම අතින් ම යහපත් වූ -----------------------------------------------------------

(ii) එම කාලයට අයිති -----------------------------------------------------------

(iii) අවුරුදු දහසක කාලය -----------------------------------------------------------

(ලකුණු 1 x 3 = 3)

(ඉ) පහත සඳහන් අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) නුසුදුසු තැනක පරිස්සමට තැබූ දෙයක් විනාශයට පත් වීම.

-----------------------------------------------------------------------------------------

(ii) අනුන් රවටන්නට ගොස් තමන්ම රැවටීම.

-----------------------------------------------------------------------------------------

(iii) දුර්ජනයින් දෙදෙනෙකුගේ එක් වීම.

------------------------------------------------------------------------

(iv) ඕනවට එපාවට යමක් කිරීම.

------------------------------------------------------------------------

(ලකුණු $^1/_2$ x 4 = 2)

## II කොටස

(09) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නූතන විද්‍යාව 16 වන ශත වර්ෂයේ දී යුරෝපයේ ආරම්භ විය. මධ්‍ය යුගයේ තාක්ෂණයත් ග්‍රීකයන් ලබා සිටි දැනුම් සම්භාරයත් විද්‍යාව හා ගණිතය පිළිබඳ නව දැනුමක් සංකලනය වීමේ ප්‍රතිඵලයක් ලෙස එය සිදු විය. මිනිසාගේ සුවසෙත සඳහා ස්වභාව ධර්මය උපයෝගී කර ගත හැකි ආකාරය ගැන විවිධ පර්යේෂණවල යෙදුණ යුරෝපයේ හා ආසියාවේ විද්වතුන්ගේ අප්‍රතිහත ධෛර්යයේ ප්‍රතිඵලයේ වූයේ නව තාක්ෂණයට මග විවෘත වීමයි. යට කී විද්වතුන් දෙකොටස ම මුහුණ දුන් ප්‍රායෝගික ප්‍රශ්න බොහෝ විට එක සමාන විය. ඔවුන්ගේ නිපැයුම් ද එක සමාන විය.

මධ්‍යතන යුගයේ පැවති වෙළෙඳාම හා සංග්‍රාම නිසා අන්තර් ජාතික සම්බන්ධතා දියුණු විය. මේ නිසා නව නිපැයුම් මෙන් ම ඒ හා බැඳුණ දැනුම ද ගෙන යාමට හැකි විය.

ක්‍රි.ව. 1500 ට පෙර නව ශිල්ප ක්‍රම ගලා ගියේ පෙරදිග සිට අපරදිගට ය. ඉන්දියාවේ හෝ චීනයේ සිට යුරෝපය දෙසට ඇදී ගිය පෙරදිග රටවල් සතුව පැවති අදහස් සම්මිශ්‍ර වූයේ ද නිපදවීම් හා ශිල්ප ක්‍රම ඒක රාශී වූයේ ද මැද පෙරදිග ප්‍රදේශයේ ය. කුරුස යුද්ධය හේතු කොට ගෙන යුරෝපයට විහිදී ගිය මෙම දැනුම් සම්භාරය මධ්‍යතන යුගයේ තාක්ෂණයේ හා විද්‍යාවේ නවෝදයට හේතු විය. කුරුස යුද්ධය ඇති වන කාලය තෙක් ම ඉන්දියාව චීනය ඇතුළු පෙරදිග රටවල පැවති දියුණු ශිෂ්ටාචාර ගැන යුරෝපීයෝ නොදැන සිටියහ. එමෙන් ම භාරතයේ සම්භාව්‍ය සාහිත්‍ය හා විද්‍යාත්මක ජයග්‍රහණ ක්‍රමයෙන් අරාබි හීබ්‍රෑ, ලතින් ආදී ග්‍රන්ථවලට ඇතුළු විය.

(i) නූතන විද්‍යාව ආරම්භවීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න.

----------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------- (ලකුණු 4)

(ii) මහාද්වීපික සම්බන්ධතා ඇති වීමට මුල් වූ කරුණු දෙකක් ලියන්න.

----------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------- (ලකුණු 4)

(iii) කුරුස යුද්ධය වෙස් වළාගෙන පැමිණි මිතුරෙකුට සමාන යයි පිළිගැනීමට හේතුව කුමක් ද?

---------------------------------------------------------------------------------------- (ලකුණු 2)

(iv) ඉන්දියාවේ දියුණුව පැවති දැනුම් ක්ෂේත්‍ර දෙකක් ලියන්න.

----------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------- (ලකුණු 4)

(v) ක්‍රි.ව. 1500 ට පෙර පෙරදිග රටවල නිපදවීම් හා ශිල්ප ක්‍රම ඒකරාශී වූයේ කිනම් ප්‍රදේශයක ද?

---------------------------------------------------------------------------------------- (ලකුණු 2)

(vi) ඡේදයේ ඇතුළත් තද්ධිත පද දෙකක් හා උපසර්ග පද දෙකක් ලියන්න.

තද්ධිත - ------------------------------------ උපසර්ග - ------------------------------------

(ලකුණු 2)

(vii) පහත සඳහන් පදවල අර්ථය ලියන්න.

(අ) අප්‍රතිහත ධෛර්යය ------------------------------------------------------------

(ආ) නවෝදය ------------------------------------------------------------ (ලකුණු 2)

(මුළු ලකුණු 20)

(ආ) පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

රන්තරු රැසින් සුදු මැලි වුණු අඳුර වැටී
කළු උණ පඳුර කඳු පාමුල වැතිර සිටී
විදුලිය වලාකුළු සිපගෙන දිවෙන හැටී
විමසමි නැවුම් කවි සිතුවිලි සමඟ ගැටී

වෙන්වුණු සොහොයුරන් වැනි කඳු ගැට මැද්දේ
කිරි දියවැල් නඟයි නැළවිල්ලක සද්දේ
පිනිබර ලිය මඩුලු කුල්මත් කොට බැද්දේ
අහසේ පහන් තරුවක් ඉහළට ඇද්දේ

කණාමැදිරියන් රුක් ගොමුවල රඟ දෙන්නේ
සංගීතයට අනුව ලූ පළගැටි යන්නේ
වන දෙව් ලියන් සිරිපා මළුවට එන්නේ
මේ මොහොතෙදි බවයි කවියන් පවසන්නේ

කවි සිතුවම් මවා මුහුණට මුහුණ බැලූ
ගිරි කුළු ඇඳ ගනී මිහිඳුම් පොකුරු සළු
පෙරදිග අහස අරුණලු රැස් වතුර ගැලූ
හිරිමල් සිනාවක් පිළිබිඹු කරන වලූ

(i) පද්‍ය පන්තියෙන් දැක්වෙන්නේ දවසේ කුමන වේලාවක් ද? (ලකුණු 2)

------------------------------------------------------------------------

(ii) මෙම වේලාව තුළ පරිසරයේ දැකිය හැකි සුන්දර සිදුවීම් දෙකක් ලියන්න. (ලකුණු 4)

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

(iii) ලිය මඩුලු සතුටට පත් වූයේ ඇයි? (ලකුණු 2)

------------------------------------------------------------------------

(iv) පෙරදිග අහසේ හිරිමල් සිනාවක් දර්ශනය වීමට හේතුව කුමක් ද? (ලකුණු 2)

------------------------------------------------------------------------

(v) මිහිඳුම් සළු පැළැඳ ගත්තේ කවුරුන් ද? (ලකුණු 2)

------------------------------------------------------------------------

(vi) පළගැටියන්ගේ සංගීතයට රඟ දෙන්නේ කවුරුන් ද? (ලකුණු 2)

------------------------------------------------------------------------

(vii) පද්‍ය පන්තියේ උපමාවක් ලියන්න. (ලකුණු 2)

------------------------------------------------------------------------

(viii) පද්‍ය පන්තියේ රූපකයක් ලියන්න. (ලකුණු 4)

------------------------------------------------------------------------

(මුළු ලකුණු 20)

## III කොටස

(10) පහත සඳහන් පාඨය කියවා වචන **50 - 60 අතර වන සේ** සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

නාට්‍යයේ ප්‍රභවය පිළිබඳ කරුණු සොයනු පිණිස අතීතයට යන විට පුද පූජා පැහැදිලි කඩ ඉමක් සනිටුහන් කරයි. ග්‍රීක නාට්‍ය දෙස බලන විට දේව විශ්වාසයන් හා නාට්‍ය අතර ඇත්තේ දැඩි සබඳතාවකි. ඩයිනීසස් දෙවියන්ට ගෞරව කිරීම සඳහා කරනු ලැබූ ගායනා තුළින් ග්‍රීක ඛේදාන්ත නාට්‍ය ප්‍රභවය ලබනු දකිය හැකිය. භාරතීය නාට්‍ය ඇරඹුයේ ද පුද පූජාවලිනි. භරත මුනිවරයා නාට්‍ය ශාස්ත්‍රය අරඹනුයේ ද 'ප්‍රණාමය සිරසා දේවා' යනුවෙන් බ්‍රහ්ම, ඊශ්වර දෙදෙනා නැමඳීමෙනි. නාට්‍යකරණයේ දී 'නාන්දි' යනුවෙන් පෙන්වා දෙන්නේ මේ පූජනීය ස්වරූපයයි. මේ අනුව ලොව පැරණිම නාට්‍ය සම්ප්‍රදාය වන ග්‍රීක නාට්‍යවලත් සංස්කෘත නාට්‍යවලත් ප්‍රභවය සම්බන්ධව ආගම මුල් වී ඇති බව පෙනේ.

කෙසේ වෙතත් නාට්‍යය යනු දෘශ්‍ය කාව්‍ය විශේෂයකි. එය නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී ලෙස දෙයාකාර වේ. සාම්ප්‍රදායික ලක්ෂණ පිළිබිඹු කරන කිසියම් ශෛලියකට අනුව ලොව අනුකරණය කිරීමේ ක්‍රමය නාට්‍ය ධර්මී වේ. එය ශෛලිගත නාට්‍ය වේ. සිදුවීමක් හෝ පුවතක් ඒ අයුරින් දක්වීම ලෝක ධර්මී හෙවත් ස්වාභාවික නාට්‍ය වේ. කවර ශෛලියකින් වුව අර්ථවත් අත්දැකීමක් ලබා දී කැලඹීමකට හසු කොට ආනන්දයෙන් ආරම්භ ව ප්‍රඥාවෙන් කෙළවර වන අපූරු කලා මාධ්‍ය නාට්‍ය නම් වේ.

(ලකුණු 20)

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ..........................................................................
   (මුල'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ..........................................................................
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ..................................
4. කලාපය : ..........................................................................
5. පළාත : ..........................................................................

| 12 / 13 ශ්‍රේණි | භාෂා භාවිතය හා අවබෝධය | කාලය පැය 03 |
|---|---|---|

I, II, III යන කොටස්වල ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.

## I කොටස

(01) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) කෙක්ක, වනිතාවෝ, මිනිසෙක් යන පදවල ප්‍රකෘති හා ප්‍රත්‍ය වෙන් කොට දක්වන්න.

..........................................................................

..........................................................................

..........................................................................

(ii) පහත දැක්වෙන නාමාවලිය අකාරාදි පිළිවෙළට සකස් කරන්න.

- අමරසේන, අමරවීර, අමරදිවාකර, අමරරත්න, අමරබන්දු, අමරසිංහ

..........................................................................

(iii) අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය තෝරන්න.

- අත්‍යාවශ්‍ය, වීරෝධාර, රිද්මානුකුල, ප්‍රාසාංගික

..........................................................................

(iv) 'රුමේනියාව' යන පදයෙහි ඇතුළත් පිල්ලම් ලියා දක්වන්න.

..........................................................................

(v) ඣ, (අ)ඃ යන අක්ෂර සහිත වචන දෙකක් ලියන්න.

..........................................................................

..........................................................................

(ලකුණු 1 x 5 = 5)

(02) (අ) පහත දැක්වෙන පද විසන්ධි කොට සන්ධි නාමය ද ලියන්න.

| | | විසන්ධිය නාමය | සන්ධි නාමය |
|---|---|---|---|
| (i) | පොල්ලත්ත | .................... | .................... |
| (ii) | අස්සන | .................... | .................... |
| (iii) | නෙලුම්මල | .................... | .................... |
| (iv) | නිරවුල් | .................... | .................... |
| (v) | සුරත | .................... | .................... |

(ලකුණු $\frac{1}{2}$ x 5 = 2 $\frac{1}{2}$ )

(ආ) පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කර සන්ධි නාමය ද ලියන්න.

| | | සන්ධි පදය | සන්ධි නාමය |
|---|---|---|---|
| (i) | කම් + හල | ---------------------------- | ---------------------------- |
| (ii) | උන් + උන් | ---------------------------- | ---------------------------- |
| (iii) | පැහැ + ඇති | ---------------------------- | ---------------------------- |
| (iv) | දව + කල් | ---------------------------- | ---------------------------- |
| (v) | දෙ + අවුරුදු | ---------------------------- | ---------------------------- |

(ලකුණු $1/2 \times 5 = 2\ 1/2$ )

(03) (අ) පහත දී ඇති පදවල තද්ධිත ප්‍රත්‍ය වෙන් කොට දක්වන්න.

(i) ස්වාභාවික ----------------------------------------

(ii) තාරුණ්‍යය ----------------------------------------

(iii) පුතණු ----------------------------------------

(iv) ගැමි ---------------------------------------- (ලකුණු $1/2 \times 4 = 2$)

(ආ) පහත දී ඇති තත්සම වචනවලින් සෑදෙන තද්භව රූප ලියන්න.

(i) විශේෂ ----------------------------------------

(ii) විද්‍යාලය ----------------------------------------

(iii) ශාස්ත්‍ර ----------------------------------------

(iv) අංජන ---------------------------------------- (ලකුණු $1/2 \times 4 = 2$)

(ඉ) පහත දී ඇති තද්භව වචන හා බැඳෙන තත්සම රූප ලියන්න.

(i) පිරික්සුම් ----------------------------------------

(ii) පිළිසකර ----------------------------------------

(iii) පවිටු ----------------------------------------

(iv) තරඟ ---------------------------------------- (ලකුණු $1/2 \times 4 = 2$)

(ඊ) පහත සඳහන් පදවල සමාස වර්ගය නම් කරන්න.

(i) නළජලය ----------------------------------------

(ii) කුකවි ----------------------------------------

(iii) දිනමිණ ----------------------------------------

(iv) වනමල් ---------------------------------------- (ලකුණු $1/2 \times 4 = 2$)

(උ) පහත දැක්වෙන කෘදන්ත පදවල ධාතු හා ප්‍රත්‍ය වෙන් කරන්න.

(i) දරන ----------------------------------------

(ii) පිසමන් ----------------------------------------

(iii) ගැටුණු ----------------------------------------

(iv) රචටන ---------------------------------------- (ලකුණු $1/2 \times 4 = 2$)

(04) එක් එක් පේළියේ මුලින් දැක්වෙන ව්‍යාකරණ වර්ගයට අයත් නො වන පදය තෝරන්න.

(i) මිශ්‍ර ක්‍රියා - දෙමින්, සෙමින්, යමින්, බොමින්
(ii) කෘදන්ත - කරත, දුවන, ලියවිලි, නැටුම්
(iii) උපසර්ග - දුදන, අනියත, සවිය, ඔවදන්
(iv) උපමා පූර්ව පද සමාස - ගල්හිත, මුවතඹර, සිසිවත, මල්හිනාව
(v) තද්ධිත - සෙල්මුවා, ප්‍රියතම, ගරුතර, කුල්මත්
(vi) සීමාවාචී නිපාත - සිටි, දක්වා, තුරු, පටන්
(vii) ද්විත්ව රූප සන්ධිය - මල්ලත්ත, කම්මල, සල්ලුයන, පොත්තල්මාරිය
(viii) අනියමාර්ථ අනුක්ත නාමපද - උපාසක, නායිකාවක, මගියෙකු, ගුරුළකු
(ix) විශේෂණ සමාස - මත්රකුසා, හේන්මිරිස්, රතුබත්, මුංඇට
(x) ක්‍රියා විශේෂණ - සෙමින්, කරකවමින්, බොහෝ, තදින්

(ලකුණු $\frac{1}{2}$ x 10 = 5)

(05) (අ) පහත සඳහන් වාක්‍යයන්හි සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.

(i) ඔහු දෙවියෙක් මෙන් මට උදව් කළේ ය.

---

(ii) නදී තොමෝ ගම් බිම් සරු කරමින් ගලා ගියෝ ය.

---

(iii) ශිෂ්‍ය නායකයන් තිදෙනෙක් කාර්යාලයට පැමිණ සිටිති.

---

(iv) මාතෘ නොහොත් මව දරුවන් පෝෂණය කරන්නී ය.

---

(v) දක්ෂ ගායකයෙක් වූ ඔහු දිවියට සමු දුන්නේ ය.

--- (ලකුණු $\frac{1}{2}$ x 5 = $2\frac{1}{2}$)

(ආ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීමට සුදුසු පද තෝරා වාක්‍ය නැවත ලියන්න.

(i) (ගායිකාවක / ගායිකාවක්) වේදිකාවට පිවිසෙන විට (ප්‍රේක්ෂකයන් / ප්‍රේක්ෂකයෝ) ජය ඝෝෂා නැගූහ.

---

(ii) (ක්‍රීඩිකයෝ / ක්‍රීඩකයන්) (සියල්ලන් / සියල්ලෝ) ම විදේශ සංචාරයට එක් වෙති.

---

(iii) (පදිකයන් / පදිකයෝ) මාර්ගයේ දකුණු පසින් ද (යතුරු පැදිකරුවෝ / යතුරු පැදිකරුවන්) මාර්ගයේ වම් පසින් ද යා යුතු ය.

---

(iv) (අපි / අප) නිවැරදි තීරණ ගතහොත් (දෙමවුපියන් / දෙමවුපියෝ) සැනසෙනු ඇත.

---

(v) වසර ගණනාවකට පසු (විදේශකයෝ / විදේශකයන්) අප රට පිළිබඳ විශ්වාසයක් තබා ඇතැයි (ඇමතිවරයෙක් / ඇමතිවරයෙකු) ප්‍රකාශ කළේ ය.

---

(ලකුණු $\frac{1}{2}$ x 5 = $2\frac{1}{2}$)

(06) (අ) පහත දැක්වෙන වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

(i) කුමරතුඟු මුනිදස්හු පිය සමර ලියූ හ. ------------------------------------------

(ii) සිංහයෙක් මහ වන මැද දී මුවෙකු මරයි. ------------------------------------------

(iii) එක දිගට ඇද හැළුණු මහ වර්ෂාව ගම්බිම් රාශියක් ජලයෙන් යට කරයි.

------------------------------------------

(iv) සමාගම් සභාපතිවරයා නවක ලේකම්වරියක පත් කර ගත්තේ ය.

------------------------------------------

(v) මවක් තම දරුවන් ආදරයෙන් පෝෂණය කළා ය.

------------------------------------------ (ලකුණු $\frac{1}{2} \times 5 = 2\frac{1}{2}$)

(ආ) පහත දැක්වෙන වාක්‍ය කර්තෘ කාරකයට හරවන්න.

(i) ඥාතීන් විසින් මියගිය ස්වකීය ඥාතිවරියගේ මෘත ශරීරය මිහිදන් කරන ලදී.

------------------------------------------

(ii) මී මැස්සන් විසින් ජනතාවට මී පැණි සපයනු ලබයි.

------------------------------------------

(iii) තාපසයෙකු විසින් වනයේ අතරමං වූ මිනිසා ගම්මානයට යවන ලදී.

------------------------------------------

(iv) මා විසින් නිවසේ දී හාවෙක් හා ලේනෙක් ඇති දැඩි කරන ලදහ.

------------------------------------------

(v) ඔවුන් විසින් අපි සාදරයෙන් පිළිගන්නා ලද්දෙමු.

------------------------------------------ (ලකුණු $\frac{1}{2} \times 5 = 2\frac{1}{2}$)

(07) (අ) මුලින් දැක්වෙන පදයේ අර්ථය නො දෙන පදය තෝරන්න.

(i) චන්ද්‍ර - සිසි, දිනිඳු, තාරපති, උළිඳු

(ii) සූර්ය - භානු, දිනමිණ, සිසිරකර, දිනකර (ලකුණු $\frac{1}{2} \times 2 = 1$)

(ආ) මුලින් දැක්වෙන පදයේ බහු අර්ථ නො දෙන පදය තෝරන්න.

(i) කර - අත, රශ්මිය, කාලය, දළිපිහිය

(ii) දද - රජ, බමුණු, කුරුල්ලා, ධජය (ලකුණු $\frac{1}{2} \times 2 = 1$)

(ඉ) පහත දී ඇති යෙදුම් සඳහා සුදුසු තනිපද ලියන්න.

(i) පුරාතනයේ සිට පැවත එන - ------------------------

(ii) මිල කළ නොහැකි - ------------------------ (ලකුණු $\frac{1}{2} \times 2 = 1$)

(ඊ) පහත දැක්වෙන අදහස දෙන ඉඟි වැකි ලියන්න.

(i) නරක කාලයක් උදා වී - ------------------------

(ii) හොඳ කාලයක් උදා වී - ------------------------ (ලකුණු $\frac{1}{2} \times 2 = 1$)

(උ) පහත දී ඇති ප්‍රකාශවලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) විශාල උත්සාහයක් දැරුව ද ප්‍රතිඵලය කුඩා වීම. ------------------------

(ii) අය මාර්ග මුළුමනින් ම විනාශ කර දැමීම. ------------------------

(ලකුණු $\frac{1}{2} \times 2 = 1$)

## II කොටස

(08) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වර්ෂ සියයකට අධික වූ බොහෝ කාලයක් බ්‍රිතාන්‍ය ජාතිකයන්ගේ ආධිපත්‍යයටත් බ්‍රිතාන්‍ය සභ්‍යත්වයට හා සංස්කෘතියටත් ගැති වී සිටි අපට අවශ්‍ය ආකාරයට අපගේ දේශය පාලනය කිරීමට ලැබූ නිදහස මෙ රට වැසි කාගේත් අමන්දානන්දයට හේතු වනු නො අනුමාන ය. එහෙත් එසේ පාලන නිදහස ලැබූ පමණින් ම අපට ජාතියක් වශයෙන් සම්පූර්ණ නිදහසක්, ආධිපත්‍යයක් ලැබිණි යැයි සිතීම යුක්ති යුක්ත වේ ද? සැබවින් ම නැත. ජාතියක් වශයෙන් නිදහස ලැබීමට නම් දීර්ඝ කාලයක් මුළුල්ලේ අප විසින් අප සමග ම, එනම් අපගේ මනස සමග ම කළ යුතු එක්තරා අනිවාර්ය සටනක් තිබේ. ඒ කුමක් ද? ඒ අනෙකක් නොව, අපගේ මනස විදේශීය ගැති බවින් මුදා නිදහස් කොට නිවහල් කොට, ස්වාධීන කොට දේශීය චින්තනයක් ප්‍රාරම්භ කිරීමයි. එසේ කරන තුරු අපට කිසි විටෙක නිසි, නියම, විධිමත් නිදහසක් ලැබිණි යැයි ස්ථිරව කිව හැකි නො වේ.

කුමක් ද දේශීය චින්තනය නම්? දේශීය චින්තනය වනුයේ මෙ රට, මේ පසේ බිහි වූ සභ්‍යත්වය, සංස්කෘතිය අනුව අපගේ සියලු කාර්ය සියලු කටයුතු හැඩ ගස්වාගෙන, ඒ අනුව ජාතියේ ඉදිරි ගමන ගෙන යැමට සිතීමයි. අපේ කෑම බීම, ඇඳුම් පැලඳුම්, සිරිත් විරිත්, සිතුම් පැතුම් ආදි භෞතික අභෞතික සියලු දැ නියම දේශීය චින්තනය අනුව සිදුවන දවසට අපට නිසි, නියම, විධිමත් නිදහස උදාවෙයි. කවර දේශපාලන නිදහසක් ලැබුණ ද යට කී නිදහස ලැබෙන තෙක් අපි අපගේ ම දේශයේ දාසයෝ වෙමු.

(i) මෙ රට වැසියන්ගේ අතිමහත් සතුටට හේතුව කුමක් ද?

---

(ii) ශත වර්ෂාධික කාලයක් තිස්සේ අප සිටි ආකාරය කෙටියෙන් දක්වන්න.

---

(iii) ජාතියක් වශයෙන් සම්පූර්ණ නිදහසක් ලැබිය හැක්කේ කෙසේ ද?

---

(iv) මෙහි දේශීය චින්තනය ලෙස දක්වන්නේ කුමක් ද?

---

(v) අප අපගේ දේශයේ දාසයන් වන්නේ කවර හේතුවක් පදනම් කරගෙන ද?

--- (ලකුණු 4 x 5 = 20)

(09) පහත සඳහන් පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සියරට නමින් කම්කරු දහඩිය පිට වේ
පොළොවට වැටුණු හැම බිඳුවම මිණි කැට වේ
සයුරට ගිළෙන විට වටිනා මුතු ඇට වේ
ඉහළට යන සුවඳ තරු වී නුබ ගෙට වේ

හිත සුව දී නගා පීඩිත ජන දිවිය
නිරත ව වැඩෙක හැකි-වෙහෙසට කල ගෙවිය
මුළු ලොව දෙස බලනු විසිකොට ගිනි අවිය
දියුණුව කියන්නේ දැතෙහි ඇති සවිය

වියපත් අනුරපුර සීගිරි දඹුලු වෙත
දූනුවත් ලෙස ගියොත් හඳුනයි අවදි හිත
කැටපත් පවුරු නටඹුන් ගල් කුළුණු මත
තවමත් හමායන දහඩිය සුවඳ ඇත

සිරි සැප පතන මිනිසා මේ වන තෙක් ම
මිරිකන මිනිස් දහඩිය හැම බිඳුවක් ම
පරිගණනය කළොත් දැක යුග යුග වික් ම
පිරි ඉතිරෙන සේය සත් සමුදුර ඉක් ම

(i) කම්කරු දහඩිය කුමන දේවල් බවට පත්වේ ද? (ලකුණු 3)

---

(ii) (අ) කවියා දියුණුව ඇතැයි විශ්වාස කරන්නේ කුමක් මත ද? (ලකුණු 2)

---

(ආ) වැඩක නිරත විය යුත්තේ ඇයි? (ලකුණු 2)

---

(iii) අතීත ජනයාගේ දහඩිය සුවඳ ඇති ස්ථාන දක්වන්න. (ලකුණු 4)

---

(iv) (අ) යස ඉසුරු අපේක්ෂා කරන පුද්ගලයා කර ඇත්තේ කුමක් ද? (ලකුණු 2)

---

(ආ) සත් සමුදුර ඉක්මවා යන්නේ මොනවා ද? (ලකුණු 2)

---

(v) කවි පෙළෙහි ඇතුළත් පහත දැක්වෙන පදවල අරුත් දක්වන්න. (ලකුණු 5)

1. මිණි - ---------------------------- 4. නටඹුන් - ----------------------------
2. නුබ - ---------------------------- 5. සත්සමුදුර - ----------------------------
3. වියපත් - ----------------------------

(මුළු ලකුණු 20)

## III කොටස

(10) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ආර්ථික විශ්ලේෂණයේ දී වෙසෙසින් උපුටා නොදැක්වෙන නමුත් සංවර්ධනයේ දී අතිශයින් වැදගත් වන තවත් සැලකිය යුතු කරුණක් නම් අධ්‍යාපනය සමාජ වෙනස්වීම් සඳහා සාධකයක් ලෙස බලපවත්නා ආකාරයයි. සංවර්ධනයේ දී පාරම්පරික සමාජ ව්‍යුහයේ පරිණාමයක් අවශ්‍ය වෙයි. තවද, ඒ සඳහා වැඩි වේගවත් සමාජ චලතාවක් ද, නව්‍යකරණයට බාධක වන සිරිත් විරිත් සහ ඇගයීම් බැහැර කිරීම ද අවශ්‍ය වෙයි. මේ වෙනස්වීම් ඇති කර ලීමෙහි ලා අධ්‍යාපනය බලවත් උපකරණයකි. අලුත් අදහස් පැතිරවීමෙන් ද, අලුත් උසස් සමාජ පන්ති පෝෂණය කරලීමෙන් ද මුළු සමාජය පුරාම නායකත්වය පිළිබඳ විවිධ රටාවන්හි වෙනස්කම් එයින් ජනිත කෙරේ. ක්‍රම සම්පාදකයෝ සංවර්ධනය හා සම්බන්ධ සමාජ සහ දේශපාලන සාධක දන්නා තරමට ම, සමාජ වෙනස්වීම් ඇති කරලීමේ මාධ්‍යයක් වශයෙන් අධ්‍යාපනයේ ඇති වැදගත්කම ගැන ද දැන ගත යුත්තෝ ය.

අධ්‍යාපන ශුභසාධක අංගයක් වශයෙන් නො ව සංවර්ධනයෙහි ලා අතිශයින් උපකාරී වන්නක් සේ අද සැලකෙන්නේ නම්, එය ප්‍රබල සහ කාර්යක්ෂම ආයුධයක් බවට පත් කර ගත යුතු ය. මෙයින් අදහස් කෙරෙන්නේ අධ්‍යාපනය මුළුමනින් ම වාගේ සංවර්ධන පරමාර්ථයේ අවශ්‍යතා අනුව හැඩගස්වා ගත යුතු බවයි. මූලික වශයෙන් මේ අවශ්‍යතා දෙයාකාර වෙයි. සංවර්ධනයේ උසස් තලවල දී ආර්ථිකය සඳහා අවශ්‍ය වන විශේෂ දක්ෂකම් ඇතියවුන් නියත වශයෙන් ලබා දීම ඉන් පළමු වැන්න වේ. නවීන කාර්මික ඥානය ගැන ජනතාව තුළ පිළිගැනීමක් මෙන් ම නවීන වූත්, විද්‍යාත්මක වූත් හැඟීමක් ඇති කර ගැනීමත් සමඟ ම සංවර්ධන අරමුණු හා ගැළපෙන අදහස් උදහස් ඇති කිරීම දෙවැන්න වේ. දෙවැනි අවශ්‍යතාව ඉතා ම වැදගත් වෙයි. කුමක් හෙයින් ද යත්, සංවර්ධනය සඳහා යොදන ප්‍රාග්ධන ප්‍රමාණයට වඩා සාමාන්‍යයෙන් ජනතාව ලබාගන්නා කාර්මික දැනීම් ප්‍රමාණය මූලික වන හෙයිනි. (ලකුණු 20)